9. ජාතික ආරක්ෂාව හා රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා පුද්ගලයන්ගේ තොරතුරු මාර්ගගත ක්‍රමවේදය භාවිතා කරමින් සත්‍යාපනය කිරීම හේතුවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයන්ට කාර්යක්ෂම හා විශ්වාසනීය සේවයක් ලබා ගැනීමට හැකිවීම.

10. දෙපාර්තමේන්තු කාර්යයන් බොහෝමයක් මාර්ගගත ක්‍රමවේදය හරහා සිදු කිරීම හේතුවෙන් කඩදාසි භාවිතය අවම කිරීම තුලින් කාන්තාරකරණය සිදුවීම වැලැක්වීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීමට හැකිවීම.

11. දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලවල වැඩ අවසන් අයදුම්පත් තැපැල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේදි තැපැල් ගාස්තු විශාල වශයෙන් ඉහල යාම මත දෙපාර්තමේන්තුවට ඇති කරන බලපෑම මගහැරීම සඳහා ඊට විසඳුමක් ලෙස පිරිවැය අවම වන පරිදි සකසන ලද ප්‍රවාහන සැලැස්මකට අනුව දෙපාර්තමේන්තුවේ රථයක් මගින් වැඩ අවසන් ඉල්ලුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන ඒම සිදුකරන ලද අතර ඒ තුලින් 90%කට අධික පිරිවැය වාසියක් දෙපාර්තමේන්තුව වෙත අත්කරදීමට හැකියාව ලැබීම.

අභියෝග :

1. අමාත්‍යාංශ මට්ටමින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයන් නිසා දෙපාර්තමේන්තුවට මුදල් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණයට කාඩ්පත් නොලැබීම.

2. යෝජිත ආයතන මගින් ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ප්‍රමාදවීම.

3. දෙපාර්තමේන්තුව තුල දිනපතා එකතුවන අයදුම්කරුවන් විසින් ආපසු බාරදෙනු ලබන පැරණි හා ප්‍රතික්ෂේපිත හැඳුනුම්පත් පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත වන හෙයින් ඒවා පරිසර හිතකාමී හා ආරක්ෂිත අයුරින් විනාශ කිරීම සිදුකළ යුතු අතර ඒ සඳහා පහසුකම් ඇති ආයතන සීමිත වීම හේතුවෙන් අපහසුතාවයට ලක්වීම.

4. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල වැඩ අවසන් අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේදී තැපැල් වියදම් විශාල වශයෙන් ඉහල යාම සහ ඒ වෙනුවෙන් ලබාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත දෙපාර්තමේන්තු පිරිවැය කළමනාකරණයේදී අනවශ්‍ය පීඩනයක් ඇතිවීම.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු **
ජ්‍යෙෂ්ඨ	30	28	2
තෘතීයික	4	3	1
ද්විතියික	1,292	1,196	96
ප්‍රාථමික	149	110	39

6.2. ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

දෙපාර්තමේන්තුවේ දැනට පවතින මානව සම්පත් හිඟය ආයතනයේ කාර්ය සාධනය සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කිරීම වළක්වනු පිණිස ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කර ඇත. එනම්,

- ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදාගන්නා පරිගණක පද්ධතිය මිනිස් ශ්‍රමය අවම වන පරිදි වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම

- දෙපාර්තමේන්තු නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ දැනට පවතින සේවක පුරප්පාඩු ඉහත දක්වා ඇති ක්‍රම මඟින් කළමණාකරනය කරන අතර මෙම පුරප්පාඩු පුරවා ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙත දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු. 000) (දේශීය)	වැඩ සටහනේ ස්වභාවය	නිමැවුම / ලබාගත් දැනුම *
1.	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පැය 150 ද්විතියික දෙමළ පාඨමාලාවේ සම්පත්දායකගේ දේශක ගාස්තු (සෙනසුරාදා / ඉරිදා සහ සතියේ දින දේශන වෙනුවෙන්) කණ්ඩායම් 03ක් සඳහා	138	පැය 150×3	337,500.00	දේශීය	හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියේ දී හා මහජන සම්බන්ධතාවයේ දී දෙමළ භාෂාව පිළිබඳව පවතින ගැටලු අවම වීම. කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය දැනුම
2.	පුරවැසි සහතික හඳුනා ගැනීම සහ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ පුහුණු වැඩසටහන	120	දින 01	28,490.00	දේශීය	හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියේ දී පුරවැසි සහතික හඳුනා ගැනීම සහ නිරවද්‍යතාවය පරීක්ෂාව පිළිබඳ දැනුම
3.	මෙහෙයුම් අංශයට අදාළ නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	100	දින 01	22,370.00	දේශීය	අභ්‍යන්තර හා බාහිර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය
4.	හැඳුනුම්පතට අදාළ සහතික පරීක්ෂා කිරීමේ පුහුණු වැඩසටහන	131	දින 02	20,060.00	දේශීය	හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියේදී පවතින ගැටලු අවම වීම
5.	ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සඳහා (Zoom තාක්ෂණය මගින්) පැවැත්වූ පුහුණු වැඩසටහන	60	දින 08	11,090.00	දේශීය	හැඳුනුම්පත සැකසීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන නිරවද්‍යව සකස් කිරීමට අවශ්‍ය දැනුම වර්ධනය තුළින් ඉහල කාර්යක්ෂමතාවය හා ප්‍රාදේශීය මට්ටමින් පවතින ගැටලු අවම වීම
6.	කාර්යාල කාර්ය සහායක මහත්ම මහත්මීන්ගේ ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	53	දින 01	3,600.00	දේශීය	අභ්‍යන්තර හා බාහිර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය
7.	නිෂ්පාදන සහායක සහ ලේඛන සහායක නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	45	දින 01	10,890.00	දේශීය	අභ්‍යන්තර හා බාහිර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය
8.	දැනුම කළමනාකරණ එක්දින පුහුණු වැඩමුළුව	15	දින 01	45,000.00	දේශීය	දැනුම කළමනාකරණයේ ඇති පරතරයන් අවම කිරීම. කාර්යක්ෂමතාව නංවා එක්දින සේවාවට ගතවන කාලය අවම කිරීම හා දෝෂ අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රවේශය

9.	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 10	45,000.00	දේශීය	නිරවද්‍යව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම
10.	පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	04	දින 01	16,000.00	දේශීය	අභ්‍යන්තර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය සහ අදාළ නිලධාරීන්ගේ ඉහළ කාර්යසාධනය
11.	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සහ රජයේ වාහන නඩත්තුව පිළිබඳ පුහුණු පාඨමාලා	02	දින 01	10,000.00	දේශීය	වියදම් පාලනය සහ අදාළ නිලධාරීන්ගේ ඉහළ කාර්යසාධනය
12.	රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු පිළිබඳ පුහුණු පාඨමාලාව	02	දින 02	15,000.00	දේශීය	අභ්‍යන්තර පාරිභෝගික සත්කාරයෙහි සාධනීය වර්ධනය සහ අදාළ නිලධාරීන්ගේ ඉහළ කාර්යසාධනය
13.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු පාඨමාලාව	01	දින 01	7,500.00	දේශීය	නිරවද්‍යව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම
14.	සංවර්ධන නිලධාරීන්ගේ සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන	03	දින 02	30,000.00	දේශීය	අදාළ නිලධාරීන්ගේ ඉහළ කාර්යසාධනය
15.	හානි හා පාඩු මු.රෙ.104 පරීක්ෂණය පිළිබඳ පූහුණු වැඩසටහන	02	දින 02	10,000.00	දේශීය	අදාළ නිලධාරීන්ගේ ඉහළ කාර්යසාධනය
16.	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන	02	දින 02	15,000.00	දේශීය	අදාළ නිලධාරීන්ගේ ඉහළ කාර්යසාධනය
17.	ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	01	වසර 01	122,500.00	දේශීය	දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය
18.	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	01	වසර 01	200,000.00	දේශීය	දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය
19.	සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	01	වසර 01	50,000.00	දේශීය	දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය
20.	රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	01	වසර 01	180,000.00	දේශීය	දැනුමෙන් පරිපූර්ණ ඉහළ කළමණාකාරිත්වය
21.	සේවාරම්භක පුහුණුව - රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020	15	දින 02	-	දේශීය	දෙපාර්තමේන්තුවට ක්ෂණිකව අනුගත වූ නවක නිලධාරි පිරිස
22.	2022 ස්ථාන මාරු වීම් ලද නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහන	40	දින 03	-	දේශීය	දෙපාර්තමේන්තුවට ක්ෂණිකව අනුගත වූ නවක නිලධාරි පිරිස සහ අඛණ්ඩ කාර්යක්ෂම මහජන සේවය

* ආයතනයක ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම

ආයතනයක ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කිරීම හමුවේ ආයතනයක මානව සම්පත වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව යොදා ගැනීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. මෙහිදී සේවාදායකයාගේ දැනුම වර්ධනය (ඉගැන්වීම) සිදුකෙරෙන අතර, මෙම දැනුම වර්ධනය මගින් සැබැවින්ම සිදුවන්නේ රැකියාවෙහි සාර්ථකත්වය ඉටු කරගැනීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කිරීමයි.

ඒ අනුව සේවාදායකයාගේ දැනුම, කුසලතාවය හා ආකල්ප වර්ධනය වීමෙන් සේවක හැකියාවන් සෘජුවම වැඩිදියුණු වෙයි. හැකියාව වැඩි වනවිට සේවකයාගේ ආත්මාභිමානය, ආත්ම විශ්වාසය හා සේවක තෘප්තිය වැඩි වන අතර එමගින් සේවක අභිප්‍රේරණය වැඩි වේ. එමෙන්ම, මෙම සෑම ගුණාංගයක් හේතුවෙන්ම සේවාදායකයාගේ කාර්යඵලය ඉහළ යනු ඇත. මේ අනුව ආයතනය සිය සේවාදායකයන්ගේ පුහුණු අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම හෝ එවැනි පුහුණු වැඩසටහන් සම්පාදනය කර ඇති ආයතන කෙරෙහි සිය සේවාදායකයන් යොමුකිරීම සිදු කරනු ලැබේ.

තවද, අඛණ්ඩව සිදුකරන පුහුණු වැඩසටහන් තුලින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර ඇති සුවිශේෂී දැනුම හා කුසලතාවන් අන් අය වෙත ප්‍රේෂණයවීමත්, සමස්ත ක්‍රියාවලිය තුල වඩා කාර්යක්ෂම හා දැනුවත් මානව සම්පතක් බිහි කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නිරවුල් නොකරන ලද ණය ශේෂයන් හා ඊට අදාළ හේතුව : **01. ඩී.එම්.ආර්.දිසානායක මයා -** කා.කා.ස.- රු.50,083.00 - සේවයෙන් පහකර ඇත. මෙම නිලධාරියාගේ බිරිඳ විසින් 2023.01.09 දින රු.35,000.00ක මුදලක් ගෙවා ඇත.(ණය මුදලින් රු.4,670.31ක් සහ ණය පොළිය ලෙස රු.30,329.69 ලෙස එම මුදල ගෙවා ඇත.) ඒ අනුව ගෙවීමට ඇති ඉතිරි ශේෂය රු.45,412.69කි.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකටම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ අංක 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම 01



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ජේඑල්ඕ/ඊ/ඩීආර්පී/එෆ්එස්/2022/01 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2023 ජුනි 01 දින

02 JUN 2023

කොමසාරිස් ජනරාල්,

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය **227-** පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ **2022** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි නති හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වාසිය ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2003.02.03 ආදායම් සංකේතය යටතේ ආදායමෙන් ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ආදායම රු.552,262,863 ක් වුව ද 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව එය රු.552,313,629 ක් වූ බැවින් රු. 50,766 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 පුනරාවර්තන වියදම්

කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වැය විෂයය අංක 227-01-01-2401 සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් රු.1,000,000 ක් ද මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් මගින් රු.180,000 ක් ද වූ මුල ශුද්ධ ප්‍රතිපාදන රු.1,180,000 ක් වෙන් කර තිබූ නමුත් 2022 වර්ෂයේ දී පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු.66,090 ක සංඝාත වියදම් වැය විෂයය අංක 227-01-01-1203 ආහාරපාන හා නිල ඇඳුම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1.මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි සහනාධාර සහ මාරු කිරීම්වල නිවැරදි වටිනාකම රු.3,882,466 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන විගණනය තුළින් පෙන්වා දුන්න ද දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කළ සන්සන්දනාත්මක අගයන් තුළ එම නිවැරදි අගය ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

1.6.4 දේපල පිරියත හා උපකරණ සංචිතය

(අ) 2022 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ කාර්යාලීය උපකරණ යටතේ ලැප්ටොප් පරිගණක 31 ක මුල වටිනාකම රු.189,500 ක් ලෙස දැක්වෙන අතර එම පරිගණක 31 ම නැවත පරිගණක උපාංග යටතේ ද දක්වා ඇති අතර එහි නිවැරදි වටිනාකම රු.4,533,285.20 වුව ද ස්ථාවර වත්කම් ලේඛනය තුළ රු.4,343,785.20 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාලීය උපකරණ හා පරිගණක උපාංගවල වටිනාකම් පිළිවෙලින් රු. 3,253,224.36 ක් හා රු. 98,204,082.76 ක් වූවද 2022 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (ACA 6) හි එය පිළිවෙලින් රු. 3,442,724.36 ක් හා 98,014,582.76 ක් ලෙස දක්වා තිබුණි.

1.6.5. ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

2021 පෙබරවාරි 08 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක DRP/OP/01/DS/03 (වෙළුම iii) ප්‍රකාරව ප්‍රාදේශීය කාර්යාලයන්හි ලේඛන පවත්වා ගැනීම් හා වාර්තා ලබාගැනීම් සඳහා පොදු ආකෘතිපත්‍ර හඳුන්වා දී ඇතත්, එකී ආකෘතිපත්‍ර අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලේඛන හා වාර්තා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.352,000,000 ක් වූ අතර මූලික ආදායම් ඇස්තමේන්තුව රු.431,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 122 ක් විය. සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු.552,262,863 ක් වූ බැවින් සංශෝධිත ආදායම ඉක්මවා රු.121,262,863 ක ඉපැයීම් පැවතුණි.

2.2 වියදම් කළමනාකරණය

2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලට අමතරව වැය විෂයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් අනුමත කර ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රතිපාදන ඉතුරුවීම්, මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර ගනු ලැබූ ප්‍රතිපාදනවලින් ප්‍රතිශතයක් ලෙස සියයට 19 සිට සියයට 79 ක් දක්වා පරාසයක පැවතුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) ජස්ට් ඉන් ටයිම්ස් ටෙක්නොලොජි ආයතනයෙන් 2020 වර්ෂයේ දී සිදුකළ කාඩ්පත් ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.56,492,100 ක් නිරවුල් කිරීමට පැවති අතර එය 2022

දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුනද වාර්තාවේ දිනය දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ 227-01-01-2509 වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉතිරිය රු.20,411,830.59 ක් වූ අතර මුළු බැරකම් වටිනාකම් රු.58,725,712.50 ක් වූ බැවින් ප්‍රතිපාදන ඉක්ම වූ බැරකම් වටිනාකම රු.38,313,881.91 ක් විය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි	
I. මූ.රෙ. 571(1)	සෑම අර්ධ වර්ෂයක් අවසානයේ දී ම ඉකුත් වූ සියලු නැන්පතු පිළිබඳ ලැයිස්තුවක් 2022 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.
II. මූ.රෙ. 565(5)	පොදු නැන්පතු සාරාංශයක් එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘතිපත්‍රය අනුව පිළියෙල කර ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි.
(ආ)2019 ඔක්තෝබර් 23 දිනැති දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ අංක DRP/IT/04/25 හි 03 වන වගන්තිය	අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හැඳුනුම්පත් අංශය වෙත ලද වහාම පරිගණක වැඩසටහනට ඇතුළත් කළ යුතු වුව ද ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීගේ අනුමැතිය ලද හැඳුනුම්පත් අයදුම්පත් පරිගණක පද්ධතියට ඇතුළත් නොකර මාසයකට අධික කාලයක් හැඳුනුම්පත් අංශයේ රඳවා ගත් අවස්ථා පැවතුණි.

(ඇ)2016 පෙබරවාරි 23 දිනැති දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ අංක DRP/OP/01/New.Ap./43 හි 11 වගන්තිය

සහනික කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර ඇති හැඳුනුම්පත් අයදුම්පත්‍රයක් දින 07 ක් ඇතුළත හැඳුනුම්පත් අංශයට භාර දිය යුතු වුව ද අයදුම්පත්‍ර හැඳුනුම්පත් අංශයට ලැබීමට දින 10 සිට දින 35 ක කාලයක් ගත වී තිබුණු අවස්ථා මෙන්ම ග්‍රාම නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් භාරදීමට දින 13 සිට දින 51 දක්වා ප්‍රමාද කාලයක් ගත වී තිබුණු අවස්ථා පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPIs) තුන අතරින් ප්‍රධාන දර්ශකයන් වන "වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව", ප්‍රතිශතයක් ලෙස සමාලෝචිත වර්ෂයේ සියයට 68 ක් විය.

3.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව විසින් ශාඛා කාර්යාල සඳහා නිකුත් කර තිබූ රු.2,736,660 ක් වටිනා UPS 131 ක්, Networking switch with Rack Mount kit 5 ක්, Printers 5ක් සහ QR Readers 38 ක් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (ACA 6) අපහරණයන් යටතේ දක්වා නිබුණි.

(ආ) 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව තුළ රු.881,500 ක් වටිනා ලැප්ටොප් පරිගණක 10 ක් අපහරණ යටතේ දක්වා ඇති නමුත් එම ලැප්ටොප් පරිගණක අපහරණය සඳහා 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තා තුළ හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2011 අගෝස්තු 25 දිනැති අංක අමප/11/1611/503/088 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ආරම්භ කර ඇති විදුලුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය මඟින් සුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත 2012 වර්ෂය සිට මේ දක්වා ස්ථාවර වත්කම් ලබා දී ඇත. එම සියලු වත්කම් සුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින්

ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුළත් කර නොමැති අතර දැනට ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුළත් වත්කම් අතරින් විදුයුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය මඟින් ලබා දුන් වත්කම් වෙන්කර හඳුනා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. තවද දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ පිහිටුවා ඇති ශාඛා කාර්යාල වෙත ද ව්‍යාපෘතිය මඟින් ලබා දුන් වත්කම් බෙදා දී ඇති නමුත් එම වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් විධිමත් වූ ලේඛන ද පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) විගණනය වෙත ලද තොරතුරු අනුව විදුයුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතිය ආරම්භයේ සිට වර්තමානය දක්වා ව්‍යාපෘතිය මඟින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හරහා ප්‍රාදේශීය කාර්යාල සඳහා වටිනාකම් රු. 114,964,961 ක භාණ්ඩ /වත්කම් ලබා දී ඇති බව දන්වා ඇතත්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව එසේ ව්‍යාපෘතිය මඟින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හරහා ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබා දී ඇති භාණ්ඩ /වත්කම් වටිනාකම් රු. 111,616,046 කි. මේ අනුව වෙනස වූ රු. 3,348,915 භාණ්ඩ /වත්කම් පිළිබඳ විගණනයේ දී තොරතුරු හෙළිදරව් නොවිණි.

3.3 අනාවරණය කළ යුතු කරුණු

2022 අගෝස්තු 09 දිනැති අංක 2292/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පැවති නැපැල් ගාස්තු 2022 අගෝස්තු 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇති අතර, ඊට අනුරූපව ජාතික හැඳුනුම්පත් ලියාපදිංචි නැපැලට යොමු කිරීම සඳහා වන රු.45 ක මුද්දර ගාස්තුව රු.110 ක් දක්වා සංශෝධනය කිරීමට අදාල අභ්‍යන්තර චක්‍රලේඛය (DRP/OP/01/DS/03 (වෙළුම iv) 2022 අගෝස්තු 18 දින නිකුත් කර ඇත. 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් දක්වා රු.4,298,895 ක වටිනාකම් සහිත මුද්දර ඇල වූ ලිපි කවර 95,531 ප්‍රමාණයක් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් ලේඛනාගාරය විසින් ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇති අතර ප්‍රමාදයකින් තොරව නියමිත කාලය තුළ ලැබුණේ නම් එම මුද්දර කවර භාවිතා කළ හැකිව තිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) සමාලෝචිත වර්ෂයේ දී මුද්‍රණය කරන ලද මුළු හැඳුනුම්පත් සංඛ්‍යාව 628,973 ක් වූ අතර ඉන් 22,497 ක් හෙවත් සියයට 4 ක් දෝෂ සහිත විය. මෙම දෝෂ සහිත හැඳුනුම්පත් PVC හා Polycarbonate යන කාඩ්පත් වර්ග දෙකෙන්ම අන්තර්ගත වූ නමුත් දෝෂ සහිත මුළු හැඳුනුම්පත් ප්‍රමාණය, උක්ත කාඩ්පත් වර්ග දෙක සඳහා වෙන වෙන ම ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වූ බැවින් දෝෂ සහිත හැඳුනුම්පත්වලට අදාලව පිරිවැය ගණනය සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් ශාඛා කාර්යාල 335 ක් සඳහා වෙන්ව හඳුනාගත් විදුලි බිල්පත් වියදම් වූ රු.5,961,205.42 ක් දෙපාර්තමේන්තු වැය විෂයය අංක 227-01-01-1403 යටතේ ගෙවීම් කිරීමකින් තොරව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ගෙවීම් කර තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට වැඩ නහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.45,413 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ නාම ලේඛනයේ නම් ඇතුළත් නිලධාරීන් 03 කගේ නම් හෝ ලබා ගත් ණයශේෂ පිළිබඳ කිසිදු සඳහනක් දෙපාර්තමේන්තුවේ 2021-2022 වර්ෂය සඳහා වූ ණයගැනි හා ණයහිමි ලේඛනයේ ඇතුළත් වී නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය සඳහා වූ ණයගැනි හා ණයහිමි ලේඛනයේ නම් සඳහන් නිලධාරීන් 05 කගේ නම් දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය තුළ ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ නාම ලේඛනයට ඇතුළත් වී නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, නත්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1475 ක් වූ අතර නත්‍ය කාර්ය මණ්ඩලය 1337 ක් වූ බැවින් පුරප්පාඩු 138 ක් නිරීක්ෂණය විය.

(ආ) නීති නිලධාරී, භාෂා පරිවර්තක (සිංහල-දෙමළ), කාර්මික නිලධාරී (සිවිල්), කාර්මික නිලධාරී(විදුලි හා ඉලෙක්ට්‍රොනික), ද්විභාෂා ලිපිකරු සහ ලිපි සහයක (දෙපාර්තමේන්තුගත) යන තනතුරු 06 හි අනුමත තනතුරු සංඛ්‍යාවම් පුරප්පාඩු වී පැවතුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට